# දැන්වීමයි

## ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කිරීම

කළමනාකරණ අධ්‍යයන පීඨයේ **2022, 2021, 2020** හා **2019** යන අධ්‍යයන වර්ෂවලට අයත් සිසුන් **2024/05/03** දිනට පෙර තම ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කර ගත යුතුය.

ඒ සඳහා **2020, 2021** හා **2022** වසරවල පළමු සමාසිකයට අයත් සිසුන් පමණක් රු. **150.00** ක ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතු ය. එම මුදල ගිණුම් අංක **008100181725841** දරණ මහජන බැංකුවේ මිහින්තලේ ශාඛාව වෙත ගෙවා අදාල කුවිතාන්සියේ පිටපත සමග අදාල වර්ෂාර්ධයේ තමන් විසින් හදාරනු ලබන විෂයයන් සඳහන් කරන ලද ශිෂ්‍ය වාර්තා පොත කාර්යාලයට භාර දී ලියාපදිංචිය අලුත් කර ගත් බවට ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙතින් අත්සන් කර ගත යුතු වේ.

**2019** අධ්‍යන වර්ෂයට අයත් සියලුම සිසුන් ශිෂ්‍ය වාර්තා පොත අලුත් කිරීමේදී අදාල වර්ෂාර්ධයේ තමන් විසින් හදාරනු ලබන විෂයයන් සටහන් කොට ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙතින් අත්සන් කර ගත යුතු වේ.

ඉහත දිනට පෙර ලියාපදිංචිය අලුත් කර නොගන්නා සිසුන්ට වර්ෂාර්ධ පරීක්ෂණ සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් නොකරන අතර මහපොළ හා ශිෂ්‍යාධාර වාරික ද පුස්තකාල සේවා පහසුකම් ද ලැබීමට හිමිකම් නොලැබෙන බැව් වැඩිදුරටත් දන්වා සිටිමි.

*සැ. යු. : ශිෂ්‍ය වාර්තා පොත පීඨයට බාර දීමේදී හා ආපසු ලබා ගැනීමේදී පීඨ කාර්යාලයේ ඇති ලේඛනයේ අත්සන යෙදීම අනිවාර්ය බව සලකන්න.*

| අධ්‍යයන වර්ෂය | ශිෂ්‍ය වාර්තා පොත් බාර ගැනීම | ලියාපදිංචි කිරීමෙන් පසු ශිෂ්‍ය වාර්තා පොත් නිකුත් කිරීම |
|---|---|---|
| **2022** | **2024/04/01- 2024/04/02** | **2024/04/25 – 2024/04/26** |
| **2021** | **2024/04/04- 2024/04/05** | **2024/04/29 – 2024/04/30** |
| **2020** | **2024/04/08- 2024/04/09** | **2024/05/02 – 2024/05/03** |
| **2019** | සතියේ දින පෙ.ව. 8.30 සිට ප.ව. 3.30 දක්වා | |

පුනර් පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අපේක්ෂා කරන සිසුන් සතියේ ඕනෑම දිනක පෙ.ව. 8.30 සිට ප.ව. 3.30 දක්වා එක් අධ්‍යයන වර්ෂයක් සඳහා රු. **150.00** ක මුදලක් ඉහත ගිණුමට බැර කර ශිෂ්‍ය වාර්තා පොත සමග මුදල් ගෙවූ රිසිට්පත කාර්යාලය වෙත ඉදිරිපත් කර ශිෂ්‍ය ලියාපදිංචිය අලුත් කර ගත යුතුය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
කළමනාකරණ අධ්‍යයන පීඨය
2024/03/27

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
කළමනාකරණ අධ්‍යයන පීඨය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

# Notice

## Renewal for Student Registration

Students belonging to the academic years **2022, 2021, 2020** and **2019** of the Faculty of Management Studies should renew their student registration before **03/05/2024**.

For that, only the students belonging to the **first semester of the academic years of 2022, 2021, 2020 will pay a registration fee of Rs. 150.00 has to be paid. The amount should be paid to the Mihintale branch of the People's Bank bearing account number 008100181725841** and the copy of the relevant receipt should be handed over to the office of the student record book stating the subjects studied in the relevant Semester of the academic year and signed by the Senior Assistant Registrar that the registration has been renewed. Should be done.

All students belonging to the academic year of **2019**, when renewing the student record book, must record the subjects they are studying in the respective semester and get it signed by the Senior Assistant Registrar.

I further inform that the students who do not renew their registration before the above date will not be issued admission cards for the examinations and will not be entitled to receive Mahapola and bursary installments and library service facilities.

** The student record book has been handed over to the faculty and retrieved from the faculty office. Note that signing the document is mandatory.*

| Academic Year | Receipt of Student Record Books | Issuance of Student Record Books after registration |
|---|---|---|
| 2022 | 2024/04/01- 2024/04/02 | 2024/04/25 – 2024/04/26 |
| 2021 | 2024/04/04- 2024/04/05 | 2024/04/29 – 2024/04/30 |
| 2020 | 2024/04/08- 2024/04/09 | 2024/05/02 – 2024/05/03 |
| 2019 | 8.30 am to 3.30 pm on weekdays | |
| **Students intending to appear for re-exams should credit the above account with an amount of Rs. 150.00 for one academic year on any day of the week from 8.30 am to 3.30 pm and submit the receipt along with the student record book to the office.** | | |

W.B.

Senior Assistant Registrar
Faculty of Management Studies
27/03/2024

Senior Assistant Registrar
Faculty of Management Studies
Rajarata University of Sri Lanka
Mihinthale